# තාඕ තේ චිං ග්‍රන්ථයෙහි සමාජ උපයෝගිතාව පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

ඩබ්. ජ්. පී. එස්. වීරසූරිය[1]

## හැඳින්වීම

දාර්ශනික සංකල්පයන්හි ප්‍රභවය පිළිබඳව විමසන කල එහි මූලාරම්භය අපරදිග මෙන්ම පෙරදිග දාර්ශනික චින්තාවන් කරා දිවයනු දැකගත හැකිය. ඒ අනුව පෙරදිග දර්ශනයේ උපත සිදුවනුයේ භාරත දේශය හෙවත් ඉන්දියාව මූලික කොට ගනිමින් වන අතර එය ක්‍රි. පූ. 5000ක් තරම් ඈත යුගයක් කරා දිවයයි. භාරතයෙහි පමණකුදු නොව චීන දේශයන්හිද දාර්ශනික චින්තාවන් අවදි වනුයේ මේ කාලවකවානුවෙහි වීම සුවිශේෂත්වයකි. ඒ අනුව ඈත පෙරදිග දර්ශනයන් පිළිබඳව අවධානය යොමු කරන කල චීන දර්ශනය සුවිශේෂී දාර්ශනික පද්ධතියක් වශයෙන් සැලකේ.කොන්ෆියුසියස් දර්ශනය මූලික කොට ගනිමින් ඇරඹි සියක් දාර්ශනික ගුරුකුලයන් චීන දර්ශනය තුළ නොමියෙන දර්ශනයක් වශයෙන් තාඕ දර්ශනය හැඳින්විය හැකිය. මෙහි ආරම්භකයා ලාඕට්සූ නම් ආචාර්යවරයා වේ. මෙම දහම ඉතාම ගැඹුරු විස්තෘත දාර්ශනික චින්තාවකි.ක්‍රි. පූ. තුන්වෙනි සියවස හෝ හතරවන සියවස අතර කාලයේ චීන දේශජ දහමක් ලෙස තාඕ දර්ශනය හෙවත් දාවො බිහිවූ බව කිව හැකිය. ලාඕට්සූතුමාගේ අහඹු හමුවීමක් මත විවරණය වන්නාවූ මෙකී දර්ශනයෙහි අත්පොත ලාඕස නමින් හඳුන්වයි. නැතහොත් දාඕ ද ජින්ග් හෙවත් තායි තේ චිං ( Tao Te Ching) ලෙසද හඳුන්වනු ලැබේ. මෙය රචනා කිරිමට හේතු වූයේ ලාඕට්සූතුමා තමා ජීවත් වූ පළාත අතහැර යමින් සිටියදී ආරක්ෂක හටයෙකුගේ දැඩි ඉල්ලීම මතය. ඒ අනුව ලාඕට්සූතුමා චීන අක්ෂර පන්දහසකින් යුත් අත් පිටපතක් ලියා ආරක්ෂකයාට දුන්නේය. ඔහුගේ දාර්ශනික චින්තා එසේ ලියාදී පළාත අතහැර ගියේය. ඉන්පසු ලාඕට්සූතුමා පිළිබඳ අසන්න නොලැබුණු බව චීන පුරාවෘත්තවල සඳහන් වේ.

තාඕ දර්ශනයේ හරය ගැබ්වී ඇත්තේ මෙම කුඩා පුස්තකයේ බව කිව යුතුය. එම ග්‍රන්ථය කෙටි පරිච්ඡේද අසූ එකකින් යුක්තය. කාව්‍ය විලාසයෙන් රචනා වී ඇති තාඕ ග්‍රන්ථය ගැඹුරු අර්ථ සහිත දුෂ්කර බන්ධනයන්ගෙන් රචනා වී ඇත. මේ නිසාම ශතවර්ෂ ගණනාවක සිටම මේ දක්වා සමහර පද්‍යවල අර්ථය පිළිබඳ විද්වතුන් අතර විවාද පවතී. මෙම අධ්‍යයනයෙහි අරමුණ වනුයේ තාඕ දර්ශනය වන අතර එහි පවත්නා සමාජ උපයෝගිතාවය පිළිබඳව ද විමසීමට

[1] පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අපේක්ෂිතය. එබැවින් මෙම අධ්‍යයනය තුළ අප විසින් සාකච්ඡාවට බඳුන් කරනු ලබන අධ්‍යයන ගැටලුව වනුයේ සැබවින්ම අක්‍රියත්වය මත පදනම් තාඕ දාර්ශනික චින්තාව තුළින් සමාජය යථාර්ථවත් කළ හැක්කේද යන්නය. තවද මෙහිදී අත්පොත වශයෙන් භාවිත කරනුයේ තාඕ තේ චිං ග්‍රන්ථය වන අතර එහි සිංහල පරිවර්තනය වන ''ස්වභාවයේ ස්වභාවයක්'' ග්‍රන්ථය භාවිතයට ගැනේ. තවද මෙම ග්‍රන්ථයෙහි පරිවර්තනය සිදු කරන ලද්දේ මහාචාර්ය ඩබ්. එම්. ගුණතිලක සූරීන් සහ ආචාර්ය චරිත හේරත් විසිනි.

උක්ත සඳහන් කළ පරිදි ගැඹුරු දහමක් වන මෙහි අන්තර්ගත වන්නාවූ විවිධ වූ දාර්ශනික චින්තාවන් විවිධාකාරයෙන් අධ්‍යයනයට ලක්වී තිබීමෙන්ම එහි පවතින්නාවූ උපයෝගීතාවය අවබෝධ කර ගත හැකිය. එසේ වුවද එකී චින්තාවන් සාකච්ඡාවට ලක්ව ඇත්තේ එයටම පමණක් පක්ෂපාත වෙමිනි. නමුදු මෙම අධ්‍යයනය තුළ එය වඩාත් වෙනස් ලෙසකින් විස්තිර්ණ වේ. ඒ අනුව මෙහිදී පිළිවෙළින් තාඕ දර්ශනය හා එහි ස්වභාවය පිළිබඳව ද එතුළින් ලබා ගත හැකි ජීවිත පරිඥානය කෙතරම් දුරට විස්තීර්ණව පවතින්නේද යන්නය. එය තාඕ නම් වූ සොබාදහමේ මඟ අනුගමනය කිරීමෙන් ලබන්නාවූ මාවතක් වේද? එසේත් නැතහොත් එය සරල හා සංකීර්ණ වේද? යනාදි කාරණා මෙතුළින් සාකච්ඡා වේ. එබැවින් තාඕහි අන්තර්ගත වන්නාවූ ජීවන කලාව හෙවත් ජීවන දර්ශනය එසේත් නැතිනම් සමාජ උපයෝගිතාවය විමසීම මෙහි මුඛ්‍යතම පරමාර්ථය වන අතර එය වර්තමාන ලෝකය හා සංසන්දනය කරනු ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණ මාතෘකාව දාර්ශනික එළඹුමකි. සාහිත්‍යමය වශයෙන් කෙරෙන දාර්ශනික විචාරයකි. එබැවින් මෙහිදී භාවිත කරනුයේ ග්‍රන්ථ පර්යේෂණ හා විශ්ලේෂී ක්‍රමවේදයයි. එසේම මෙය ගුණාත්මක පර්යේෂණයක් වන අතරම විස්තරාත්මක ද වේ. ඒ අනුව මෙම අධ්‍යයනය තුළදී ප්‍රාථමික හා ද්වීතියික මූලාශ්‍ර යොදා ගනු ලබන අතර ප්‍රාථමික මූලාශ්‍ර යටතේ තාඕ දර්ශනය පිළිබඳ රචනා කරන ලද කෘති යොදා ගන්නේ වුවද වඩාත් අවධානය යොමු වනුයේ තාඕ තේ චිං ග්‍රන්ථයෙහි පර්වර්තනය වන ''ස්වභාවයේ ස්වභාවයක්'' ග්‍රන්ථයයි. එසේම විෂය ප්‍රාමාණික අදහස් ද ලබා ගැනීමට අපේක්ෂිතය. ද්වීතියික මූලාශ්‍ර වන තාඕ දර්ශනය අළලා රචිත ශාස්ත්‍රීය ලිපි, ග්‍රන්ථ සේම අන්තර්ජාලය භාවිත කරමින් මෙම අධ්‍යයනය උදෙසා දත්ත රැස් කිරීම පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙහිදී විචාරාත්මක ක්‍රමය හරහා විස්තරාත්මකව රැස් කරගනු ලැබූ දත්ත විශ්ලේෂණයට බඳුන් කරනු ලැබේ. එහිදී වඩාත් විශ්ලේෂී මාවතක් ඔස්සේ තාඕ දර්ශනයේ සමාජ

උපයෝගිතාවය හෙවත් ජීවන දර්ශනය වර්තමාන සමාජය සමඟ ගළපමින් අධ්‍යයනය කරනුයේ දාර්ශනික එළඹුමකිනි.

### දත්ත හා සාකච්ඡාව

තාඕ දර්ශනය පිළිබඳව අවධානය යොමුව ඇත්තේ අල්ප වශයෙනි. විශේෂයෙන්ම ඉංග්‍රිසි මාධ්‍යය ඔස්සේ මේ පිළිබඳ රචනා කරන ලද කෘතීන් හඳුනා ගත හැකි වුවද සිංහල කෘතීන් බෙහෙවින්ම අල්පය.එබැවින් මෙම අධ්‍යයනය වඩාත් සුවිශේෂී වේ. එසේ වුවද ස්වභාවයේ ස්වභාවයක් ග්‍රන්ථය ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදුකරනු ලබන බැවින් තාඕ දර්ශනයේ පවත්නා වූ දාර්ශනික මූලධර්මයන් හඳුනා ගැනීමට ඉඩප්‍රස්තාව ලැබේ. එසේම ඒ ඔස්සේ තාඕහි අන්තර්ගත වන්නාවූ දාර්ශනික විවරණයන්හි ජීවන දර්ශනය ප්‍රමුඛ කොට ගැනේ.තවද වත්මන් සමාජ සංසිද්ධීන් උදෙසා එහි පවතින නිරවද්‍යතාවය අධ්‍යයනය කෙරේ.

### නිගමනය

චීන දර්ශනයෙහි සුවිශේෂී ස්ථානයක් උසුලනු ලබන තාඕ දර්ශනයේ පවත්නා වූ සමාජ උපයෝගීතාවය මෙම අධ්‍යයනය යටතේ විශ්ලේෂණයට බඳුන් කරන බැවින් වඩාත් සමාජ යහපත උදෙසා තාඕහි උපයෝගිතාවය කෙසේ පවත්නේ දැයි විමසුමට ලක් කෙරේ. එසේම වර්තමාන සමාජයේ බෙහෙවින් සාකච්ඡාවට ලක් වන්නාවූ සමාජ ප්‍රශ්නයන් උදෙසා නිරවද්‍ය පිළිතුරක් මෙම අධ්‍යයනය ඔස්සේ අපට අවබෝධ කර ගත හැකිය. බොහෝදුරට ස්වභාව ධර්මය වෙනස් කරමින් ඉදිරියට පිය තබන්නාවූ ගෝලියකරණයට ලක්වූ තාක්‍ෂණික ලෝකයක අතරමංව සිටින මිනිසාට තාඕ දර්ශනය මඟින් ලබා දෙන්නාවූ උපදේශය මහත් අගනේය. පවත්නා ස්වභාවයට එරෙහි නොවෙමින් ලෝකයේ මංපෙත් විවර කර ගන්නට මිනිසාට නොහැක්කේ මන්ද? හුදෙක් ආශාවට වහල් වී දිවි ගෙවන පෘථග්ජන මිනිසාට තම සුවය ලෞකික ජීවිතය තුළින්ම ලබන්නට මෙමඟින් මොනවට සුව කැන්දයි. එපමණක් නොව තම බඩ වියත පිළිබඳ පමණක් සිතා අනෙකුත් සතාසිවුපාවුන් නොසලකා හරින ලෝකයා නිවැරදි මාවතක් වෙත කැන්දා ගෙන යයි. තවද බල ලෝබයට ලොල් වී තම ජනයාගේ සුබ සිද්ධිය නොතකා කටයුතු කරන්නාවූ රාජ්‍ය පාලකයින්ටද තාඕහි දර්ශනය යහපත් දේශපාලන දර්ශනයක් වේ. සමස්තයක් වශයෙන් ගත් කල තාඕ දහම වූ කලී ජීවන මංපෙතකි. එසේ වතුදු සැබවින්ම එමඟින් ලබා දෙන්නාවූ උපදේශයන් ප්‍රායෝගික මිනිසාට ක්‍රියාත්මක කළ හැක්කේද යන්න විටෙක ගැටලුවකි. මන්ද ස්වභාව මාර්ගය අනුගමනයෙන් පමණක් මිනිසාට ජීවත් විය හැක්කේද යන්න ගැටලුවකි. සොබාදහමට පමණක් අවනත වී මිනිසාට සංවර්ධනයක් කරා යා

හැක්කේ කෙසේද? එසේම නිහඬ ක්‍රියාකාරීත්වය පමණක් අගය කළ හැක්කේ කෙසේද යන්න වත්මන් සමාජයට කෙතරම් උපයෝගී වන්නේද යන්නද මෙම අධ්‍යයනය හරහා සාකච්ඡාවට ලක් කරනු බැවින් මෙය වඩාත් සුවිශේෂී අධ්‍යයන මාතෘකාවක් බව කිව යුතුමය. තවද මේ අනුව චීන දර්ශනය තුළ ලාඕට්සුතුමා විසින් ආරම්භ කරන ලද තාඕ දර්ශනය සුවිශේෂී වන බව පැහැදිලිය. මන්ද යත් මෙහිදී සාකච්ඡාවට බඳුන් වන මාතෘකාව යටතේ විශාල කරුණු ප්‍රමාණයක් අනාවරණය කර ගත හැකි වීමය. එනම් තාඕහි ජීවන කලාව සැබවින්ම මිනිසා විසින් වින්දනය කළ යුත්තකි. එය සොබාදහම හා මිනිසා එකට යා කරන්නාවූ සංහිඳියාවේ පාලමක් වැනිය. අක්‍රීයත්වය තුළින් ජීවිතය ජය ගත හැකි බවද සඳහන්ව තිබීම මහායානය හා බැඳි සබැඳියාවද ගම්‍ය කරවයි. එමෙන්ම තාඕ යෝග මිනිසාගේ භෞතික ශරීරය පමණක් නොව මානසික, අධ්‍යාත්මික ගුණ වගාව දක්වා කැඳවා ගෙන යනුයේ සොබාදහම නමැති ඒකීයත්වය තුළිනි. තවද චී ශක්තිය තුළින් සෞඛ්‍යමත් දිවියක් ළඟා කර ගන්නා අයුරුද මෙමඟින් මොනවට ගම්‍ය කෙරේ. එපමණක් නොව මිනිසාගේ මැඩලිය නොහෙන ලිංගික ශක්තිය උත්කර්ෂණය කරමින් තමා තුළම පවතින මම සොයා යාමටද ජීවන පිටු පෙරළයි. තවද රෝග නිවාරණය මෙහි සුවිශේෂී උපයෝගීතාවයක් බවද පෙනේ. සමස්තයක් වශයෙන් ගත් කල තාඕහි අන්තර්ගත සමාජ උපයෝගීතාවය හෙවත් කියා නිම කළ නොහෙන කතන්දරයක් බව අධ්‍යහාර වී අවසන්ය. එය එතරම්ම මහැඟි දයාදකි.

**ප්‍රමුඛ පද** : තාඕ දර්ශනය, සමාජය, සොබාදහම, අක්‍රීයත්වය

**ආශ්‍රිත ග්‍රන්ථ**


ගුණතිලක; ඩබ්. එම්, චරිත හේරත්. (2000). *ස්වභාවයේ ස්වභාවයක*: හාරිස්පත්තුව: සමන් හේරත් ප්‍රකාශන

ගුණතිලක; ඩබ්. එම්., (2001), *තාඕ යෝග,* නුගේගොඩ: පියසිරි ප්‍රින්ටර්ස්.

සුමනසිරි හිමි, පල්ලේකැලේ. (1999). *සාම්ප්‍රදායික චීන ආගම්.* හරස්කාව: කර්තෘ ප්‍රකාශන.

Hartz, R Paula. (2009). *World Religions*. New York: Daoism, Chelsea Houes.

Max, kaltenmark. (1965). *Lao Tzu & Taoism*. California: Stan Ford University Prress.